**ජාතික ආරක්ෂක අරමුදල- 2013**

-------------------------------------

ජාතික ආරක්ෂක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ආයෝජන ලේඛනය යනාදියෙන් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල පනතේ 12(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

අරමුදල් පනතේ 12(4) වගන්තියේ සඳහන් අරමුදලේ කටයුතු පරිපාලනය පිළිබඳ මාගේ වාර්තාව පහත සඳහන් ඡේදයන්හිද ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය මෙහි ඇමුණුම 01 ලෙස ද අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශය ඇමුණුම 02 ලෙස ද දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ආරක්ෂක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අරමුදල සතුව පැවති රු.15,700,000 ක් පිරිවැය වූ දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වත්කමක් භාවිතය සඳහා සුදුසු තත්ත්වයට පත්කළ අවස්ථාවේ සිට ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත් එයට පටහැනිව වත්කම් මිලදී ගත් වර්ෂයට ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ එක් එක් ක්‍රියාකාරකම් අනුව මුදල් ගලාගෙන ඒම් සහ ගලාගෙන යාම් පිළිබිඹු වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

1987 වර්ෂයේ දී අරමුදල වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු ලද දිනට වටිනාකම රු.150,000 ක් වූ මැණික් ඔබ්බවන ලද ඔටු රූපය 1989 වර්ෂයේ දී ජනාධිපති ලේකම් කාර්යාලයට භාරදුන් බව ලිඛිතව සනාථ කර තිබුණි. කෙසේ වුවද එහි භෞතික පැවැත්ම අරමුදල විසින් සනාථ කර ගෙන නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

------------------------------------------------------------------------------

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කළයුතු වුවද ජාතික ආරක්ෂක අරමුදල සතු ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් එපරිදි ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවල අතිරික්තය රු.80,688,937 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.57,510,514 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.23,178,423 ක වර්ධනය සඳහා ආයෝජන පොළී ආදායම රු.19,793,907 කින් හෙවත් සියයට 30 කින් වැඩිවීම හා සුභසාධන වියදම් රු.3,389,602 කින් හෙවත් සියයට 47 කින් අඩුවීම. ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

තම රාජකාරී කටයුතු ඉටුකරන අතරතුර දී තුවාල ලද හෝ මියගිය පොලිස් බළකායේ හෝ සන්නද්ධ හමුදාවල හෝ යම් සාමාජිකයකුගේ පවුල්වලට යම් ප්‍රතිලාභ ගෙවීම ඇතුළුව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීමට වඩාත්ම හේතු වන්නේ යැයි අරමුදලේ පාලක මණ්ඩලය අදහස් කරන ආකාරයට සහ කාර්යයන්ට අරමුදලට අයත් මුදල් ජනාධිපතිවරයාගේ විධිවිධානවලට යටත්ව යොදා ගැනීම අරමුදලේ පාලක මණ්ඩලයේ කාර්ය වී තිබුණ ද වාර්ෂිකව උපයන ආදායම අදාල අරමුණ සඳහා උපයෝගී කරගැනීම ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. පසුගිය වර්ෂ 05 ක් තුළ ලැබී තිබුණු ආදායම් සහ ඊට අදාලව දරා තිබුණු සුභසාධක වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ලැබී ඇති මුළු ආදායම | සුභසාධක වියදම | ලද ආදායමෙන් සුභසාධක වියදම් සඳහා වැය කර ඇති ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | |
| 2009 | 78,037,379 | 5,500,000 | 7.05 |
| 2010 | 75,509,010 | 40,108,739 | 53.12 |
| 2011 | 49,082,045 | - | 0 |
| 2012 | 64,988,177 | 7,238,435 | 11.14 |
| 2013 | 84,776,544 | 3,848,832 | 4.54 |

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

යුද්ධ හමුදාවේ පරිහරණය සඳහා කුළියට ලබා දී තිබුණු අරමුදල සතු නිවාස 3 ක් සඳහා 2012 සහ 2013 වර්ෂ සඳහා වූ එකතුව රු.721,500 ක් වූ ගෙවල් කුළිය 2014 ජුලි 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. මෙම නිවාස සඳහා අයකරන කුළිය අවසන් වරට සංශෝධනය කර තිබුණේ 2006 වර්ෂයේ දී වන අතර මේ වන විට වසර 08 ක් ගත වී තිබුණ ද අයකරන කුළිය නැවත සංශෝධනය කිරීමට අරමුදල කටයුතු කර නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

අරමුදල විසින් සිය බැංකු ජංගම ගිණුමක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව ඉක්ම වූ ප්‍රමාණාත්මක මුදලක් නිරන්තරව නිෂ්කාර්යව තබාගන්නා බව විගණනයට නිරීක්ෂණය විය. මේ අනුව අරමුදල සතු මුදල් ප්‍රතිලාභයන් සහිත මාර්ගවල නිරන්තරයෙන් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් විධිමත් පිළිවෙතක් අනුගමනය කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් ජාතික ආරක්ෂක අරමුදල විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත් 2013 දෙසැම්බර් 31 දින වන විටත් එය පිළියෙල කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

----------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි

**5.3 කාර්යසාධන වාර්තාව**

------------------------

2002 සැප්තැම්බර් 12 දින හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත ජාතික ආරක්ෂක අරමුදල විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2014 ඔක්තෝබර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**5.5 පාලක මණ්ඩල රැස්වීම**

--------------------------

ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේ ද පාලක මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ ලේකම්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කල යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය කළමනාකරණය

ඇමුණුම 01

**ජාතික ආරක්ෂක අරමුදල 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය.**

--------------------------------------------------------------------------------------------------------------------

| ආදායම් | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| පරිත්‍යාග | 34,281 | 39,820 |
| ආයෝජන පොලී | 84,076,263 | 64,282,357 |
| ගෙවල් කුලී | 666,000 | 666,000 |
| | 84,776,544 | 64,988,177 |
| **වියදම්** | | |
| කාර්ය මණ්ඩල දීමනා | 20,400 | 20,400 |
| සුභසාධන වියදම් | 3,848,832 | 7,238,435 |
| ගොඩනැගිලි ක්ෂය | 174,875 | 184,078 |
| රණවිරු පරිත්‍යාග | 43,500 | 34,750 |
| | 4,087,607 | 7,477,663 |
| **වියදමට වැඩි ආදායම** | **80,688,937** | **57,510,514** |

ඇමුණුම 02

**<u>මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශය</u>**

| ආයෝජනය කරන ලද ආයතනය | ගිණුම් අංකය | ආයෝජන දිනය | කාල සීමාව | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | | (අවු) | රු. |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0001/21/20267 | 2013 අගෝස්තු 28 | 01 | 118,569,341 |
| භාණ්ඩාගාර බිල්පත් | LKB00515G159 | 2013 ජූලි 19 | 01 | 75,014,360 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/78148 | 2013 සැප්තැම්බර් 21 | 01 | 98,027,365 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/75815 | 2013 ජූනි 27 | 01 | 94,421,360 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/75807 | 2013 ජූනි 27 | 01 | 88,566,222 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/75823 | 2013 ජූනි 27 | 01 | 110,880,615 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/69297 | 2013 දෙසැම්බර් 28 | 01 | 52,056,475 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/73189 | 2013 මාර්තු 24 | 01 | 66,182,776 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/75912 | 2013 ජූනි30 | 01 | 9,766,673 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/75939 | 2013 ජූනි 30 | 01 | 12,566,717 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/76722 | 20013 ජූලි 16 | 01 | 2,072,948 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/76749 | 2013 ජූලි 16 | 01 | 2,072,948 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/10/25058 | 2013 මාර්තු 31 | 01 | 400,000 |
| මහජන බැංකුව | 0033-261-070152-4 | 2013 සැප්තැම්බර් 30 | 01 | 26,288 |
| ජාතික සංවර්ධන බැංකුව | 108250754499 | 2013 පෙබරවාරි 20 | 01 | 3,517,657 |
| ජාතික සංවර්ධන බැංකුව | 108250784606 | 2013 අප්‍රේල් 01 | 01 | 5,951,000 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/78202 | 2013 සැප්තැම්බර් 25 | 01 | <u>200,000</u> |
| | | | | <u>740,292,745</u> |